# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1404/2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி |
| දිනය<br>Date | 09/11/2023<br>පැය 0655 | | |

## මාධ්‍ය නිවේදනය

**මනුෂ්‍ය ඝාතනයක් - ත්‍රිකුණාමලය වරාය පොලිස් වසම.**

2023.11.08 වන දින අළුයම් කාලයේදී පුද්ගලයෙකු පපු ප්‍රදේශයේ ඇණුම් තුවාල සහිතව ප්‍රතිකාර සඳහා ත්‍රිකුණාමලය රෝහලේ බාහිර රෝගී අංශයට රැගෙන ඒමේදී මියගොස් ඇති බවට ත්‍රිකුණාමලය රෝහල් පොලිසිය මඟින් ලද දුරකථන පණිවිඩයක් මත ත්‍රිකුණාමලය වරාය පොලිසිය විසින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

සිදුකරන ලද විමර්ශනයේදී ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරට අනුයුක්තව රාජකාරි කරන නාවික සෙබලුන් සිව්දෙනෙකු ඔවුන් නවාතැන්ගෙන සිටින ස්ථානයේ මත්පැන් පානය කර ඇති බවට නිරීක්ෂණය වන අතර, මත්පැන් පානය කර දෙදෙනෙකු එම ස්ථානයෙන් පිටවයාමෙන් පසු මරණකරු සහ අනෙක් සෙබලා අතර ඇති වූ බහින් බස් වීමක් දුර දිග යාම හේතුවෙන් මරණකරුට තියුණු ආයුධයකින් ඇණ ඇති බවට සිදු කරන ලද විමර්ශනවලදී අනාවරණය වී ඇත.

**මරණකරු වයස අවුරුදු 36 ක් වන කන්දේගෙදර, මාතලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සිද්ධියට සම්බන්ධ සැකකරු ත්‍රිකුණාමලය වරාය පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇති අතර ඔහු වයස අවුරුදු 42 ක් වන ඉඹුල්ගොල්ල, මාතලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. ත්‍රිකුණාමලය වරාය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**